


**By: Lakshman Abeykoon**
Web. http://jyotisha.00it.com

## මේෂ ලග්නය

**කලක සිට බලාපොරොත්තුව සිටි අදහසක් ඉෂ්ඨවේ**

**ධනය**

කලක සිට බලාපොරොත්තුව සිටි අදහසක් ඉෂ්ඨවේ වැඩි උත්සාහයක් නැතිවම මිල මුදල් ලාභද ලැබෙන්නට හේතුයි දේපල කටයුතුද ඇතිවිය හැක දේපල බෙදීම්ද අන්‍ය උරුමක් කාරයන් ඇතිවීම්ද දේපල පිලිබද ඔප්පු ලිවීම් ආදිය ඇතිවිමද මේ කාලයේ සිදුවිය හැක බලාපොරොත්තු ඉෂ්ට වේ ආදායම වැඩිවේ ලාභ ප්‍රයෝජන ලැබෙන කාලයක ජනවාරි පෙබරවාරි මාස හොදයි වර්ශය මැද භාගයේදී දේපල ස්ථානලාභ ලැබෙන්නටද ඉඩ ඇත නමුත් අගභාගය කරදර සහිතයි

**රැකී රක්‍ෂා**

කරන කියන කටයුතු හෝ රැකිරක්‍ෂාවලින් බලාපොරොත්තු රහිත ලාභ ලැබේ දියුනුව ඇතිකරන කාලයකි විදේශ ගතවීමට බලාපොරොත්තුව සිටින අයටද ඒ සදහා පහසුකම් සැලසේ ගුරු මහදශා ඇති අයට හොදයි නමුත් අනිත් අයට පවතින අපල වලට බෝධිපූජා ආදිය නිතර කලේ නැතිනම් ඉහත හොද ප්‍රතිපල ලැබෙන අතරම රැකී රක්‍ෂාවල කරදරද හිතේ සාමය නැතිවීමද වෙහෙස ඇති දුර ගමන් යෙදීමද පවුලේ අයගෙන් ඈත්වීම හෝ පවුලේ කරදර ඇතිවීමද ලජ්ජා අවනම්බු වීදීමට සිදුවීමද වෙහෙස ඇති සතුටක් නැති ගමන් යාමට සිදුවීමද නිෂ්පල වුද වියදම් අධික වූද ගමන් බිමන් යාමට සිදුවේ කරගෙන ආ කටයුතු කඩාබිදවැටීමටහෝ ඒවාට භාධා සිදුවීමට හෝ පුලුවන රැකීරක්‍ෂාවල තත්වය පිරිහීමද වැනි අපලද වරින්වර ඇතිකරත් පරිස්සම් විය යුතු කාලයකි

**ගෘහ ජීවිතය**

සාමාන්‍යයෙන් ගෙදර දොර වාසනාවනත කාලයකි මංගල යෝග දරු ශිෂ්‍ය ලාභාදිය ලැබේ සිතට කයට සැප විලවන සියලු දේ ලැබෙන කාලයකි සාමාන්‍යයෙන් දියුනුවටද ඉඩ තිබේ හොද ආහාරපාන වර්ගද වාහනද ලැබෙන්නට පුලුවන අනුමානයට කරන වැඩ සාර්තකවී දියුනුව ලැබේ විවාහ මංගල්‍ය වැනි ප්‍රීති උත්සව ඇතිවේ ජීවිතයේ එක් අමුතු උදාවක් ඇතිකරන කාලයකි එසේ වුවත් පවතින අපල වලට පිලියම් කලේ නැතිනම් නිතර පාහේ කනගාටු දායක වූද සිත් තැවුල් කරන්නාවුද කටයුතු සිදුවේ ධන හානි වීමට ඉඩ තිබේ සතුරන් නිසා නිතරම සිතට භය සැක ඇතිකරන කාලයකි

**අධ්‍යාපනය**

අලුත් දේ ඉගනීමට ලැබේ නමුත් විභාග වලට සුභ කාලයක් නොවේ

**සෞඛ්‍යය**

කේතු හයවැන්නේ ගමන් කරන කාලයේදී ශරීර සනීපය ඇතිවේ අසනීප ගති තිබුනේනම් ඒවායින් සුවය ලැබේ නමුත් වාත රෝග වැනි අසනීප වැලදීමට පුලුවන පවුලේ වැඩිහිටියෙකුටද ඉතා අපල දායක කාලයකි

## වෘෂභ ලග්නය

**ධන ලාභ ලැබේ**

**ධනය**

සෙනසුරු තුන් වැන්නේ ගමන්කරන කාලයේදී ධන ලාභ ලැබේ සිත ප්‍රීතිමත් කාලයකි දියුනුව ඇතිවේ බලාපොරොත්තු රහිත හදිසි මිලමුදල් ලාභ ලැබෙන්නටද පුලුවන රාහු හෝ සෙනසුරු දශා අතුරු දශා ඇති අයට හොදයි නමුත් ගුරු හෝ කේතු වැනි දශා අතුරුදශා ඇති අයට වියදම් අධික කාලයකි

**රැකී රක්‍ෂා**

කරගෙන ආ කටයුතු මෙන්ම අමුතුවෙන් ආරම්භ කරන කටයුතු ද දියුනුවේ තත්වය උසස්වේ සතුරන්ගෙන් ජය ලැබේ තම බලය වැඩිවේ වාසනාවන්ත කාලයකි තම රැකීරක්‍ෂා තනතුරු ආදිය දියුනුවේ

**ගෘහ ජීවිතය**

දේපල ලාභ ලැබේ අයිතිවාසිකම් ලැබේ උසස් අය හා ආශ්‍රය ඇතිවේ උසස් අයගෙන් උපකාරද ලැබේ අසනීප වලින් සුවය ලැබේ උත්සව වලට හෝ සමාගම් වලට ආරාධනා ලැබේ ලොකු ලාබ පවා ලැබෙන්නට ඉඩ තිබේ වාසනාවන්ත කාලයකි රැකීරක්‍ෂා වලින් උසස්වේ නම හොදවේ නම්බුව ලැබේ සමාජයෙහි තම තත්වය ඉහලයයි දියුනුව සදහා කරගෙන යන කටයුතු තවතවත් දියුනුවේ ආදායම වැඩිවේ අලුත් හිතමිතුරන් ඇතිවේ මංගල යෝගද ඇතිකරන කාලයකි වැදගත් ගමන් යාමට ලැබේ ඉඩම් හෝ ගෙවල් ලාභ ලැබේ සෑම උත්සාහයකින්ම ප්‍රතිපල ලැබෙන කාලයකි කලින් තිබුන තත්වයට වඩා දියුනුවට කටයුතු සැලසේ ඉඩකඩම් වාහන ගෙවල්දොරවල් ආදිය ලැබෙන්නටද මංගල්‍ය කටයුතු ස්තිරවන්නට හෝ ඒවායේ යෙදෙන්නට ඒවාට සහභාගීවනනටද ඉඩ ලැබේ අලුත් මිත්‍රයන් නෑදෑයන් ලැබෙන්නටද පුලුවන උසස් අය සමග ආශ්‍රය කිරමටත් ඔවුන් සමග හිත මිත්‍රකම් පැවැත්වීමටත් අවස්තාව ලැබෙන්නට පුලුවන පවුලේ දියුනුවටද හේතුඇත සතුරන් ඊර්ෂියාකාරයින් ඇතිවේ

**අධ්‍යාපනය**

ඉගෙන ගත්දෙයින් ප්‍රයෝජන ලැබියහැකි කාලයකි

**සෞඛ්‍යය**

ශරීර සනීපයටද හේතුයි රාහු එකොලොස් වැන්නේ ගමන්කරන කාලයේදී ශරීර සනීපය ඇති කරයි නමුත් පවුලේ අයට හා දරවන්ට අසනීපාදී කරදර ඇතිකරන කාලයකි හදිසි අනතුරු වලින් ප්‍රවේසම් විය යුතුය ශරීරයේ තුවාල ඇතිකල හැකි කාලයකි

## මිතුන ලග්නය

**ලද පමනින් සතුටුවීමට පුරුදු විය යුතු කාලයකි**

**ධනය**

ශනි දෙවැන්නේ ගමන්කරන කාලය අපල දායකයි මේකාලයේදී අනුන්ගෙන් ධනය ලැබුනත් එය වැඩිකලක් පැවතීමට හෝ එයින් සතුටුවීමට සිදුනොවේ අදීක වියදම් සහිත කාලයකි නිෂ්පල දෙයට වියදම් වේ මුදල් රදන්නේ නැති කාලයකි ලැබෙන්නට තියෙන මුදල් පවා නොලැබේ සමහරවිට නය ගනුදෙනු වලටද බැදෙන්නට සිදුවෙ

ශනි දෙවැන්නේ ගමන්කරන කාලය අපල දායකයි මේකාලයේදී අනුන්ගෙන් ධනය ලැබුනත් එය වැඩිකලක් පැවතීමට හෝ එයින් සතුටුවීමට සිදුනොවේ අදීක වියදම් සහිත කාලයකි නිෂ්පල දෙයට වියදම් වේ මුදල් රදන්නේ නැති කාලයකි ලැබෙන්නට තියෙන මුදල් පවා නොලැබේ ධන හානියටද ඉඩ තිබෙන බැවින් වස්තුව ආරක්‍ෂාකර ගතයුතුයි

**රැකී රක්‍ෂා**

රාහු දසවැන්නේ ගමන් කරන කාලයේදී උසස් අය හෝ තම සවාමියන් සමග හෝ වැඩ කරුවන් නැතිනම් තමා සමග වැඩ කරන අයගෙන් කරදර හා හිරි හැරද ඇතිවන්නට පුලුවනි අලුත් වැඩකට හෝ රක්‍සාවකට යාමටද සිදුවීමට පුලුවන කේලාම් ඕපදූප නිසා සිත් තැවුලු ඇතිවේ පවුලේ කරදර හිරිහැර අමනාපකම් ඇතිවේ නරක මිනිසුන්ගේ ආශ්‍රයට වැටේ නරක සිරිත්ද ඇතිවන්නට පුලුවන තිබුන ගෞරව සැලකිලි නැතිවීයයි ඒ අතරම කරන යම්කිසි වැඩකින් සැනසීමක්ද ඇතිවිය හැක ලද පමනින් සතුටුවීමට පුරු-දු විය යුතු කාලයකි

**ගෘහ ජීවිතය**

පවුල් අවුල් වියවුලු අසමගිකම් ඇතිවේ පවුලේ අයට අපල කාලයකි හිතවත් ඥාතියෙකු ගැන කනගාටු දායක පුවතක් අසන්නටද සිදුවේ චෝදනා නින්දා අපහාස ලැබෙන්නට ඉඩ තිබෙන බැවින් කල්පනා කාරීව ක්‍රියාකල යුතු කාලයකි කෙසේනමුත් ශනි 2වැන්නෙන් යාමට පෙර නින්දාවක් හෝ ආරවුලක් ඇතිවේ වරදකරුවෙක් වේ දුක් කනගාටු කරදර ඇති අවාසනාවන්ත කාලයකි පහත් අයගේ ආශ්‍රය ඇතිවන හෝ සතුරන් ඇතිවන කාලයක විශේශයෙන් හදිසි අනතුරු වලින් ප්‍රවේසම් විය යුතුය දූරගමන් හෝ ගොඩනැගිලි වැඩ වලට බැසිමට අසුබ කාලයකි

සෙනසුරු හෝ කේතු දශා ඇතිඅයට නිවසේ කරදර සහිත කාලයකි නමුත් ගුරු හෝ රාහු දශා අතුරුදශා ඇති අයට යහපත් කාලයකි නමුත් පවතින අපල වලට ග්‍රහපූජා බෝධි පුජා ආදිය කරනවානම් වැඩ කටයුතු ආදිය සිතැගි පරිදි සිද්ධවේ කලක් නැවතී තිබුන කටයුතුද නැවත පටන්ගැනේ නොයෙක් කටයුතුවලින් ලාභ ලැබේ උසස් නිලතල හෝ රැකීරක්‍ෂා ආදියද ලැබෙන්නට පුලුවන ශරීර සෞඛ්‍යය යහපත්වේ ධන ලාභ ලැබේ ආදායමද හො-දවේ ව්‍යාපාර කටයුතුවලිනි ලාභ ලබන්නට මග සැලසේ බලාපොරොත්තු දේවල් ආදිය ලැබේ

**අධ්‍යාපනය**

සම්මුක පරීක්‍ෂන විභාග ආදී කටයුතු මේකාලයේදී බලවත් උනන්දුවෙන් හා උත්සාහයෙන් යුතුව සාර්තක කරගන්නවා විනා වාසනාවට ලැබේයයි සිතීම නොකලයුතුය

**සෞඛ්‍යය**

හදිසි අනතුරු විපත්ති ඇතිවියහැකි කාලයකි ධන හානි ඇතිවේ සැප පහසුව අඩුකරයි ශරීරය දූර්වලවීම හෝ ශරීර ලක්‍සනය හා පැහැපත්බව අඩුවේ අසනීපවලට හේතුයි දත්මුල් දියවේ දත් සෙලවෙන්නට ගනී උන ආබෘධ ආහාර නොදිරවීමේ රෝග ලේ දෝෂ සාදනිනට පුලුවන

## කටක ලග්නය

**කරගෙන ආ කටයුතුවල වෙනසක්**

**ධනය**

කේතු තුන් වැන්නේ ගමන් කරන මේ කාලයේදී බලාපොරොත්තු රහිත ලාභ ලැබේ ධාර්මික ලාභ ලැබේ හොද දේ නිපයීමට හෝ සොයා ගැනීමට ලැබේ කරදර සහිතව උවත් සිත් සතුටටද කරුනු සැලසේ මිල මුදල් අතින් යහපත් කාලයකි නමුත් පවතින අපල වලට පිලියම් කර ගත්තේ නැතිනම් බලාපෙරොත්තු තරමට වඩා තම ආදායම අඩුවෙන බැවින් නය තුරුස් ආදිය ඇතිවීමටද පුලුවන කරගෙන ආ කටයුතුවල වෙනසක් ද ඇතිකල හැක නොතේරුම් කමින් හෝ තමා නොදැනම වැරදි සිදුවේ ධන හානියක්ද ඇතිවන කාලයකි රාහු නවවැන්නේ ගමන් කරන කාලයේදී වියදම සැර වී මිලමුදල් අතින් කරදර ඇතිවේ නිකරුනේ ධන හානි වේ තමාගේ ධනය අනුන් විසින් පැහැර ගැනීම හෝ අනුන්ට දුන් මිල මුදල් ආදිය ආපසු නොලැබීම හෝ නියමයි ආදායම අවහිරවේ

**රැකී රක්‍ෂා**

මහන්සියේ තරමට වැටුප් හෝ දක්‍ෂකමේ තරමට තැන නොලැබේ එබැවින් මේ කාලයේදී ඉවසීමත් ලද පමනින් සතුටුවීමත් පුරුදුකර ගැනීම හොදයි උසස් අයගෙන්ද තමාට විපත්ති ඇතිවිය හැකි බැවින් මේ කාලයේදී කල්පනාවෙන් ඒ අය ආශ්‍රය කලයුතුයි ජීවිතයේ අමුතු පරිච්ජේදයක් පෙරලෙන්නටද පුලුවන

**ගෘහ ජීවිතය**

පවතින අපල වලට පිලියම් කර ගත්තේ නැතිනම් ශනි ලග්නයේ ගමන්කරන කාලය අපල දායකයි නොයෙකුත් ක්‍රමයෙන් විපත්තිද අනතුරුද ඇතිකරයි හදිසි අනතුරු පවා ඇතිකලහැකියි බලාපොරොත්තු රහිත අධික වියදම් සිදුවේ තදලෙසම සිතට කරදර ඇතිවේ පවුලේ කෙනෙකුට හෝ ඉතා හිතවතෙකඳට තද අපල කාලයකි මේ කාලයේදී නඩුහබ වලට පැටලුනොත් නිතියේ පිහිට නොලැබී පරාජයට පත්වීමට පුලුවන දූර පලාත්වල දුෂ්කර මහන්සි සහිත වාහන හෝ පා ගමන් කීපයක්ම යෙදෙනවා ඇත නමුත් ඒවායින් ලොකු ප්‍රයෝජනයක් නොලැබේ නිතර ශරීරයේ කුනු ගෑවෙන කටයුතු වල යෙදීමට හෝ එවැනි තැන්වල ආශ්‍රය ඇතිවීමට හෝ හේතු තිබේ බැවින් නිතර කිලිටි හෝ තද රලු ගොරෝසු වස්ත්‍ර අදින කෙනෙක් ලෙස පිට අයට දරශනය වන්නට පුලුවන රුවටීම් වලට පහසුවෙන් අසුවියහැකි කාලයක් නිසා ව්‍යාපාර හෝ විවාහ සහකරුවන් නැතිනම් කොන්ත්‍රාත් කරුවන් හෝ හවුල්කරුවන් සොයිගැනීමේදී මේ කාලය තුල ප්‍රවේසම් වීම හොදයි මවුපිය හෝ වැඩිහිටි ඥාතින්ට යහපත සැලසෙන කාලයකි

**සෞඛ්‍යය**

ශරීර සනීපයද යහපත් නොවේ පරන අසනිප මේකාලයේදී නැවත මතුවන්නට පුලුවන නැතිනම් වේදනා ගෙන දෙනසන්ධි ආභාධයක් හෝ පාදයක අමාරුවක් වන්නට පුලුවන

**ඉතිරි කොටස ලබන කලාපයේ**